*Journal of Social Statistics* *Page 53 - 64*
*JSS (2022) Vol (9) Issue (1)*

# පේෂ කර්මාන්ත නිෂ්පාදනවල නිරතවන්නන් මුහුණපාන ගැටළු (මහනුවර දිස්ත්‍රික්කය ඇසුරින්)

ප්‍රසාදිනි තන්තිරිගේ[1]

***සංක්ෂේපය***

*ශ්‍රී ලංකාව තුළ පේෂ කර්මාන්තය ක්‍රිස්තු පූර්ව 543න් වැනි ඔබ්බට දිවෙන දිගු ඉතිහාසයක් ඇති අතර එමගින් ග්‍රාමීය ප්‍රජාවන් කෙරෙහි රැකියා උත්පාදනය කරනු ලබයි. නමුත් වර්තමානයේ පේෂ කර්මාන්තය ඵලදායිතාවය පවත්වාගෙන යාම සඳහා විවිධ ගැටළු රැසකට නිෂ්පාදකයින් මුහුණ දෙමින් සිටිති. ඒ අනුව මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වනුයේ මහනුවර දිස්ත්‍රික්කයේ පේෂ කර්මාන්ත නිෂ්පාදන සිදු කිරීමේ දී නිෂ්පාදකයින් මුහුණපාන ගැටළු හඳුනා ගැනීමයි. ශ්‍රී ලංකාව තුළ දිස්ත්‍රික්කය මට්ටමෙන් පේෂ කර්මාන්ත නිෂ්පාදකයින් වැඩි පිරිසක් සිටින්නේ මහනුවර දිස්ත්‍රික්කය වන බැවින් අධ්‍යයන ප්‍රදේශය ලෙස මහනුවර යොදා ගනිමින් සරල සසම්භාවී නියැදි ක්‍රමවේදය යටතේ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව තුළ ලියාපදිංචිව සිටින නිෂ්පාදකයින් 240දෙනෙකුගෙන් ප්‍රශ්නාවලි ක්‍රමය මගින් දත්ත රැස් කර ඇත. මෙම දත්ත විශ්ලේෂණය කිරීම සඳහා බහුගුණ ප්‍රතිපායනය, සාධක විශ්ලේෂණය සහ කයි වර්ග පරීක්ෂාව යන දත්ත විශ්ලේෂණ ක්‍රම යොදා ගන්නා ලදී. ඒ අනුව සාධක විශ්ලේෂණය මගින් පේෂ කර්මාන්ත නිෂ්පාදන සිදු කිරීමේ දී නිෂ්පාදකයින් මුහුණපාන ප්‍රධාන සාධක 3ක් ගම්‍ය විය. ඒවා නම් රජය මැදිහත් නොවීමේ ගැටළු, තාක්ෂණික හා සුබසාධක ගැටළු, මූල්‍ය හා නව්‍යකරණ ගැටළු යන සාධක බලපාන බව සොයා ගනියි. මෙලෙස පේෂ කර්මාන්තය නිෂ්පාදකයින් මුහුණ පාන ගැටළු මඟහරවා ගැනීම සඳහා රජය මගින් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, අන්තර්ජාලය හා නවීන විද්‍යුත් ක්‍රම හරහා අලෙවිකරණ කටයුතු සිදු කිරීම ආදිය යෝජනා ලෙස පෙන්වා දිය හැකිය.*

***මුඛ්‍ය පද : පේෂ කර්මාන්ත නිෂ්පාදන ආශ්‍රිත ගැටළු, මහනුවර දිස්ත්‍රික්කය***

## 1. හැඳින්වීම

දේශීය රෙදිපිළි කර්මාන්තය පිළිබඳව සැලකීමේදී අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයට ලැබෙනුයේ සුවිශේෂි ස්ථානයකි. සම්ප්‍රදායික රෙදි විවීමේ ශිල්පයක් වන අතර එය ආකර්ෂණීය සාරි, නිමි ඇඳුම්, තිර රෙදි, ඇඳ ආවරණ, කුෂන් කවර හා සෙල්ලම් බඩු නිෂ්පාදනය ආදී රෙදිපිළි මෝස්තර සෑදීම සඳහා පරම්පරා ගණනාවක ශිල්පීන් විසින් පුහුණු කරනු ලැබේ. ඈත අතීතයේ පටන් ග්‍රාමීය ජන ජීවිතය හා බැඳි පැවති අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය මගින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ඉටු කළ හැකි සේවය අති විශාලය (ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව, 2017). මෙම කර්මාන්තය වටිනාකමක් උසුලන්නේ පරිසර හිතකාමී, අඩු බලශක්තියෙන් ක්‍රියාත්මක වන අංශයක් වන අතර ශ්‍රී ලංකාවේ 2012 වර්ෂය වන විට පේෂ කර්මාන්ත

---

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
prasadinithanthirigr@gmail.com

රෙදිපිළි අංශය විසින් ගෙන එන ලද මුළු අපනයන වටිනාකම ඇමරිකානු ඩොලර් 870,000 ක් ලෙස දක්වා ඇත. එසේම 2020 වර්ෂය වන විට එය ඇමරිකානු ඩොලර් මිලියන 44ක් උපයාගෙන තිබේ. එසේම අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය 2012 වර්ෂයේ දී සෘජු රැකියා අවස්ථා 10,000ක් පමණ ලබා දී ඇති අතර 2020 වර්ෂය වන විට එම සංඛ්‍යාව 14,300 ලෙස වර්ධනය වී තිබේ (ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව, 2020). එසේම ශ්‍රී ලංකාවේ පේෂ කර්මාන්ත නිෂ්පාදන විදේශිය වෙළෙඳපොල තුළ ඉහළ ඉල්ලුමක් පවතින අතර ඒ හේතුවෙන් 2020 වසරේදී එක්සත් ජනපදය සඳහා 46% ක ප්‍රමාණයක් නිෂ්පාදනය කර ඇති අතර එක්සත් රාජධානිය සඳහා 14% ලෙසත්, ඉතාලියට 10% ලෙසත් නිෂ්පාදනය කර තිබේ (ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, 2020). පේෂ කර්මාන්තයේ තිරසාර වර්ධනයක් ඇති කිරීමේ අරමුණු පෙරදැරි කර ගනිමින් කාර්යසාධන බලකායේ නිර්දේශයට අනුව ස්ථාපනය කරනු ලැබූ අතර 2015 වර්ෂය වන විට මෙරට කර්මාන්ත 962ක් ස්ථාපනය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 2020 වසරේදී දේශියව උපයන ලද මුළු අලෙවි ආදායම රුපියල් 55,160,458ක් විය. එසේම 2020 වර්ෂය වන විට අලෙවිකරණ මධ්‍යස්ථාන 117ක් ස්ථාපනය කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස භෞතික ප්‍රගතිය 100%කි (ශ්‍රී ලංකා කර්මාන්ත හා වාණිජ කටයුතු සංවර්ධන අමාත්‍යංශය, 2018). මෙවැනි හේතු සාධක පවතින බැවින් එය ප්‍රවර්ධනය කිරීමට පේෂ කර්මාන්තයේ නියැලෙන්නන් මුහුණපාන ගැටළු අධ්‍යයනය කිරීම වැදගත් වේ. ඒ පිළිබඳව අවධානය යොමු කරමින් නිෂ්පාදකයන් මුහුණදෙන ගැටළු පිළිබදව ද අධ්‍යයනය කිරීමට පර්යේෂණය තුළින් බලාපොරොත්තු වේ.

**2. පර්යේෂණ ගැටළු**

පේෂ කර්මාන්ත නිෂ්පාදන සිදු කිරීමේ දී නිෂ්පාදකයින් මුහුණපාන ගැටළු මොනවාද?

**3. පර්යේෂණ අරමුණු**

පේෂ කර්මාන්ත නිෂ්පාදන සිදු කිරීමේ දී නිෂ්පාදකයින් මුහුණපාන ගැටළු හඳුනා ගැනීම.

**4. පර්යේෂණ ක්‍රමවේදය**


ශ්‍රී ලංකාව තුළ පළාත් මට්ටමෙන් පේෂ කර්මාන්ත නිෂ්පාදකයින් වැඩි පිරිසක් සිටින්නේ මධ්‍යම පළාත තුළ වීම හා මධ්‍යම පළාතේ වැඩිම නිෂ්පාදකයින් සංඛ්‍යාවක් සිටින දිස්ත්‍රික්කය ලෙස මහනුවර දිස්ත්‍රික්කය පෙන්වා දිය හැකිය. එබැවින් අධ්‍යයන ප්‍රදේශය ලෙස මහනුවර දිස්ත්‍රික්කය යොදා ගනිමින් සරල සසම්භාවී ක්‍රමවේදය යටතේ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව තුළ ලියාපදිංචිව නිෂ්පාදකයින් 240දෙනෙකුගෙන් ප්‍රශ්නාවලි ක්‍රමය මඟින් දත්ත රැස් කරයි. මෙසේ රැස් කරගත් දත්ත යොදාගනිමින් පේෂ කර්මාන්ත නිෂ්පාදන කටයුතු සිදු කිරීමේ දී නිෂ්පාදකයන් මුහුණදෙන ගැටළු අතර වඩාත් ප්‍රබල ලෙස මුහුණදෙන ගැටළු හඳුනාගැනීම සඳහා සාධක විශ්ලේෂණ යොදා ගනී.

## 5. ශ්‍රී ලංකාවේ පේෂ කර්මාන්තයේ නිරතවන්නන් මුහුණපාන ගැටළු සහ අභියෝග

විවෘත ආර්ථික ප්‍රතිඵලය වඩාත් අහිතකර ලෙස බලපානු ලැබුවේ ශ්‍රී ලංකාවේ දේශීය රෙදිපිළි කර්මාන්තයට වන අතර, විශේෂයෙන්ම අත්යන්ත්‍ර රෙදිපිළි අංශය බොහෝ දුරට අසංවිධානාත්මක අංශයේ ක්‍රියාත්මක වීම. එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ සමාගම් ව්‍යාපාරවලින් ඉවත් විය. 1978 මහ බැංකු කාර්මික සමීක්ෂණයට අනුව, ආනයන ලිහිල් කිරීමෙන් වසරකට පසුව සමාගම් 1300 න් සමාගම් 200 ක් ව්‍යාපාර වසා දමන ලදී (Gunatilaka, 1997). විවෘත ආර්ථික ප්‍රතිපත්තිය පෙර මෙරට පැවති අත්යන්ත්‍ර රෙදිපිළි 110,000 න් 30,000 ක් පමණ 1980 වන විට ක්‍රියා විරහිත වී ඇති බව පේෂකර්ම අමාත්‍යාංශය විසින් සකස් කරන ලද අසංවිධානාත්මක අත්යන්ත්‍ර රෙදිපිළි අංශයේ ඇස්තමේන්තුවලින් පෙනේ. අත්යන්ත්‍ර සහ පේෂකර්ම අමාත්‍යාංශය විසින් 1990 ගණන්වල ක්‍රියාත්මක වූ අත්යන්ත්‍ර යන්ත්‍ර සංඛ්‍යාව 20,000ක් ලෙස දක්වා ඇත. එබැවින් අත්යන්ත්‍ර රෙදිපිළි අංශයට රැකියා අවස්ථා උත්පාදනය කිරීමට සහ අපනයන ඉපැයීම් සඳහා ඇති හැකියාව අතිශයින් සීමිත විය (Kelegama,1999).

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කළ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන බොහෝ දෙනා පේෂ කර්මාන්ත නිෂ්පාදනවල යෙදී සිටින අතර ඔහුන් විවිධ ගැටළු හා අභියෝගවලට මුහුණ දෙමින් සිටිති. අම්පාර දිස්ත්‍රික්කය අධ්‍යයන ප්‍රදේශය ලෙස තෝරා ගනිමින් සිදු කරනු ලැබූ පර්යේෂණයක් මඟින් නිෂ්පාදකයින් මුහුණ දෙන ගැටළු හා අභියෝග ගවේෂණය කර තිබේ. මෙලෙස ප්‍රස්තාර, වගු භාවිතයෙන් සිදු කරනු ලැබූ විශ්ලේෂණයට අනුව පහත ගැටළු හඳුනාගෙන ඇත (Risna, 2021).

ප්‍රස්තාර සටහන 1 : ශ්‍රී ලංකා පේෂ කර්මාන්තයේ නියැලෙන්නන් මුහුණ දෙන ගැටළු




*මූලාශ්‍රයඃ Risna, 2021*

ප්‍රස්තාර සටහන 1ට අනුව පැහැදිලි වන්නේ නිෂ්පාදකයින් වැඩි ප්‍රමාණයක් එනම් 21% අමුද්‍රව්‍ය හිඟ වීම නිසා පීඩා විඳිති. එසේම 20%ක් නවීන යන්ත්‍රසූත්‍ර නොමැති වීම යන ගැටළුවලට මැදි වී සිටින අතර 17%ක් මූල්‍යමය ගැටළු පවතින බවත් නිරූපණය වේ. විලාසිතා තාක්ෂණය නොමැති වීම හා ණය සැලැස්මක් නොමැති වීම යන ගැටළුවලට 10%ක් ලෙස සමාන ප්‍රතිශතයකින් ප්‍රතිචාර දක්වා තිබේ. මෙම

ප්‍රස්තාර සටහනට අනුව 6%ක් වැනි ඉතා අඩු පිරිසක් බදු ගැටළුවලින් පීඩා විඳින බව නිරූපණය වේ.

පේෂ කර්මාන්තයේ නියැලෙන්නන් පිළිබඳව 1992 වර්ෂයේ දී ද සිදු කරනු ලැබූ එවැනිම සමීක්ෂණයකට අනුව නිෂ්පාදකයින් මුහුණදෙන ගැටළු හඳුනාගෙන තිබේ.

වගු අංක 1: පේෂ කර්මාන්තයේ නියැලෙන්නන් මුහුණ දෙන ගැටළු

| ගැටළු | පෞද්ගලික අංශය (%) | රාජ්‍ය අංශය (%) | සමුපකාර (%) | එකතුව (%) |
|---|---|---|---|---|
| අමුද්‍රව්‍ය නොමැති වීම | 26 | 34 | 48 | 29 |
| අරමුදල් නොමැතිකම | 27 | 2 | 17 | 25 |
| අමතර කොටස් සහ උපාංග නොමැතිකම | 14 | 10 | 10 | 10 |
| වියන්නන්ගේ හිඟය | 9 | 41 | 11 | 16 |
| අලෙවිකරණ ගැටළු | 17 | 3 | 8 | 14 |
| වෙනත් | 6 | 9 | 7 | 6 |
| එකතුව | **100** | **100** | **100** | **100** |

*මූලාශ්‍රය: Gunatilaka,1997*

වගුව අංක 1ට අනුව පෙනී යන්නේ 29%ක් වැනි ඉහළ ප්‍රතිශතයක් අමුද්‍රව්‍ය නොමැති වීම ලෙස ප්‍රතිචාර දක්වා තිබේ. දෙවනුව වැඩිම පිරිසක් ප්‍රතිචාර දක්වා තිබෙන්නේ නිෂ්පාදන සිදු කිරීමට අවශ්‍ය අරමුදල් නොමැතිකමය. එම අගය 25%කි. එසේම අමතර කොටස් සහ උපාංග නොමැතිකම, වියන්නන්ගේ හිඟය, අලෙවිකරණ ගැටළු, වෙනත් යනාදිය සඳහා ප්‍රතිචාර දැක්වීම පිළිවෙලින් 10%, 16%, 14% හා 6% වේ.

ඒ අනුව සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ පේෂ කර්මාන්තය අඩු ඵලදායිතාව, දුර්වල යටිතල පහසුකම්, තරඟකාරී ආයෝජන අවස්ථා නොමැතිකම, ශ්‍රම හිඟය වැනි බාධකවලට අමතරව නිපුණතා සහ නුපුහුණු මට්ටම්, දේශීය ඉල්ලුම පහත වැටීම සහ නූල් සැපයීමේ ගැටළු තනි ආයතනවලට අරමුදල් නොමැතිකම, යල්පැනගිය තාක්ෂණය, වෙළෙඳපොල අවස්ථා පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම, දේශීය වෙළෙඳපොලට පමණක් නිෂ්පාදනය කිරීම, දුර්වල සැලසුම් හැකියාවන් වැනි දැඩි බාධකවලට මුහුණ දීමට සිදුවේ (Gunatilaka, 1997).

කෙසේ වෙතත් රටක ජන ජීවිතය සහ ජීවනෝපාය දියුණු කිරීමට කුඩා පරිමාණ කර්මාන්ත අවශ්‍ය වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ පේෂ කර්මාන්ත නිෂ්පාදන ආශ්‍රිතව පවතින ගැටළු පිළිබඳව සිදු කරනු ලැබූ අධ්‍යයනය මඟින් පේෂ කර්මාන්තයේ නියැලෙන්නන් බොහොමයක් මධ්‍යම පාන්තික හා අඩු ආදායම්ලාභි පවුල්වල ජනතාව වන අතර, ඔවුන් නිශ්චිත ලාභයක් නොමැති වුව ද අත්යන්ත්‍ර රෙදි හා රෙදි විවීමේ කර්මාන්තයට වැඩි වශයෙන් සම්බන්ධ වී සිටීම විශේෂත්වයකි. එහෙත් ඔවුන් බොහෝ දුෂ්කරතාවලට මුහුණපාන අතර පාරිසරික ගැටළු, ශ්‍රමිකයන්ට ප්‍රමාණවත් වැටුපක් නොලැබීම, නිෂ්පාදන සිදු කිරීමේ දී අමුද්‍රව්‍ය ප්‍රමාණවත් තරම් නොමැති වීම හා රාජ්‍ය ව්‍යවසායක ගැටළු යනාදිය ඒ අතර ප්‍රධාන වේ (Nussbaum, 2007).

ශ්‍රී ලංකාවේ අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නියැලෙන්නන් මුහුණපාන ගැටළු යන මාතෘකාව ඔස්සේ සිදු කරනු ලැබූ පර්යේෂණයක් සඳහා යාපනය දිස්ත්‍රික්කය නියැදි ප්‍රදේශය ලෙස තෝරාගෙන තිබේ. මෙම අධ්‍යයනයේ ප්‍රතිඵලයක් වී ඇත්තේ යුද්ධය පැවති කාලය තුළ නිෂ්පාදකයින් සමාජමය ගැටළු රැසකට මුහුණ දී ඇති බවයි (Hasan, 2021).

කෙසේ වෙතත් Hettiarachchige (2020) දක්වන ආකාරයට ශ්‍රී ලංකාවේ පරම්පරාගතව පැවත එන පැරණි රෙදි අත්යන්ත්‍ර කර්මාන්තය තරඟකාරී වෙළෙඳපොල තත්ත්වයන්ට විසඳුම් සෙවීමට ශිල්පින් තුළ දැනුම නොමැතිකම, පාරිභෝගිකයාට නිසි වටිනාකමක් ලබා ගැනීමට හැකි නිෂ්පාදන සිදුකිරීමට නොහැකි වීම රෙදි විවීමේ කර්මාන්තය පරිහානියට තුඩු දෙන ප්‍රධානම ගැටළු ලෙස පෙන්නුම් කරනු ලබයි.

මඩම්පැල්ල රෙදි විවීමේ කර්මාන්තශාලාව ඇසුරින් සිදු කළ පර්යේෂණයකට අනුව නිෂ්පාදන අලෙවි කිරීමට අපහසු වීම, ප්‍රමිතියෙන් අඩු බව, වෙළෙඳපොලේ මිල ආදේශක හා දුර්වල වෙළෙඳ දැන්වීම යනාදි ගැටළු අලෙවිකරණය තුළ පැන නැගී ඇති බව අධ්‍යයනය මඟින් හඳුනාගෙන තිබේ. මේ හේතුවෙන් නිෂ්පාදකයින් අභියෝග රැසකට මුහුණ දෙමින් සිටියි (Wijenayaka, 2021).

තවද පේෂ කර්මාන්තයේ නිරතවන්නන් බොහෝමයක් ව්‍යවසායකයන් නොවේ. මේ හේතුවෙන් නිෂ්පාදන වෙළෙඳපොල තුළට ප්‍රවේශ කිරීම අතරමැදියන් මත රඳා පවතී. මෙම තත්ත්වය නිෂ්පාදකයින් හට ඔවුන්ගේ ඉපැයීමේ හැකියාව සැලකිය යුතු ලෙස අඩු කරයි. එසේම නිෂ්පාදකයින් සැලසුම්ගත ක්‍රියාවලියක් ඔස්සේ නව්‍යකරණයක් සිදු නොකරයි. මෙහි ප්‍රතිඵලයක් ලෙස වටිනා වෙළෙඳපොල වෙත නිෂ්පාදන ප්‍රවේශ වීම සීමා වේ (Goswami, 2018).

ශ්‍රී ලංකාවේ මඩම්පැල්ල ගම්මානයේ පේෂ කර්මාන්ත නිෂ්පාදකයින්ට අත්යන්ත්‍ර සංවර්ධනය කිරීමට, අළුත්වැඩියා කිරීමට අධික වියදමක් දැරීමට සිදුවීම, යාන්ත්‍රික හිඟය සහ නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දී නොමැතිකම ආදී ගැටළුවලට මුහුණ දෙයි (Wijenayaka, 2021). මීට අමතරව Risna (2021) වර්ෂයේ සිදු කළ පර්යේෂණය මඟින් ද පෙන්වා දෙන්නේ ප්‍රතිචාර දැක්කුවන්ගෙන් 10%ක් ප්‍රකාශ කර ඇත්තේ විලාසිතා දැනුම මෙන්ම විලාසිතා තාක්ෂණ පිළිබඳ ඌනතාවයෙන් පෙළෙන බවයි.

මරුතමුනෙයි ප්‍රදේශයෙහි ඩයි කම්හල් 9 ක් ස්ථාපනය කර ඇති අතර, එයින් කම්හල් 8ක් මුහුදට ආසන්නයේ පිහිටා ඇත. නමුත් මෙම කම්හල් හේතුවෙන් අවට පිහිටා ඇති ළිංවල ජලයේ ආම්ලික අගය වෙනස් වීම ආදි ගැටළු ඇති වී තිබේ. තවද ඩයි කිරීමෙන් පසු සහ අපජලය ඍජුවම ජලයට මුදා හැරීම නිසා එහි ජීවත්වන ජීවීන්ට අහිතකර වන අතර ඒ හේතුවෙන් සතුන් හා ශාකවලට ද බලපෑම් ඇති වේ. එය ඍජුවම ජෛව විවිධත්වය අවදානමට ලක්විය හැකිය. එසේම රෙදි විවීමේ දී නිපදවන කපු වාතය දූෂණය කරයි. ඒ හේතුවෙන් මෙම කර්මාන්තයේ නිරතවන්නන් විශාල ගැටළුවකට මුහුණ දෙමින් සිටියි (Risna, 2021).

## 6. පේෂ කර්මාන්ත නිෂ්පාදකයින් මුහුණපාන ගැටළු සඳහා සාධක විශ්ලේෂණය

විචලතා ආකෘතියක් විස්තර කළ හැකි වඩාත් හොඳම රේඛීය සම්බන්ධතා කාණ්ඩය තෝරා ගැනීම සඳහා සාධක විශ්ලේෂණය සිදු කරයි. ඒ අනුව පේෂ කර්මාන්ත නිෂ්පාදකයින් මුහුණපාන ගැටළු 13 ක් පිළිබඳව දත්ත රැස් කර ඒවායෙන් ප්‍රමුඛතම ගැටළු මොනවාද යන්න හඳුනා ගැනීම සාධක විශ්ලේෂණය සිදු කර ඇත.


වගු අංක 2: KMO සහ Bartlestt's පරික්ෂාව

| KMO and Bartlett's Test | | |
|---|---|---|
| Kaiser-Meyer-Olkin Measure of Sampling Adequacy. | | **.832** |
| Bartlett's Test of Sphericity | Approx. Chi-Square | 935.116 |
| | Df | 78 |
| | Sig. | **.000** |

*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2022*

සාධක විශ්ලේෂණයේ දී KMO සහ Bartlestt's පරික්ෂාව අවධානය යොමු කිරීමේ දී යොදාගනු ලබන දත්තවල වලංගුභාවය පරීක්ෂා කරයි. මෙහිදී KMO අගය මඟින් නියැදියේ ප්‍රමාණවත් බව සහ Bartlestt's පරික්ෂාව මඟින් නියැදියේ Sphericity පරීක්ෂා කරනු ලබයි. KMO අගය 0.05ට වඩා විශාල විය යුතු අතර Bartlestt's අගයෙහි P අගය 0.05ට වඩා අඩු අගයක් ගත යුතුය. මෙම අධ්‍යයනය අනුව KMO අගය 0.832 වන අතර Bartlestt's අගයෙහි P අගය 0.000 වේ. එනම් 0.05 ට අඩු බැවින් මෙම සාධක විශ්ලේෂණය අධ්‍යයනය සඳහා යෝග්‍ය වේ.

ප්‍රස්තාර සටහන 1: අයිගන් අගය Principal Component Analysis




*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2022*

ප්‍රස්තාර සටහන 1 මඟින් ප්‍රධාන සංරචක ගණන ගණනය කිරීමට හැකියාව පවතී. ඒ අනුව 1ට වඩා වැඩි වන ලක්ෂයේ පවතින ප්‍රමුඛ සංරචක ප්‍රමාණය අධ්‍යයනය සඳහා යොදා ගනියි. මෙහි ප්‍රධාන සංරචක 3ක් යැයි තීරණය කළ හැකිය.

වගු අංක 3: පූර්ණ විචලනය

| Component | Initial Eigenvalues | | | Extraction Sums of Squared Loadings | | |
|---|---|---|---|---|---|---|
| | Total | % of Variance | Cumulative % | Total | % of Variance | Cumulative % |
| 1 | **4.399** | 33.840 | 33.840 | 4.399 | 33.840 | 33.840 |
| 2 | **1.479** | 11.378 | 45.218 | 1.479 | 11.378 | 45.218 |
| 3 | **1.402** | 10.785 | 56.003 | 1.402 | 10.785 | 56.003 |
| 4 | .900 | 6.921 | 62.925 | | | |
| 5 | .833 | 6.409 | 69.333 | | | |
| 6 | .795 | 6.113 | 75.447 | | | |
| 7 | .657 | 5.055 | 80.502 | | | |
| 8 | .549 | 4.226 | 84.728 | | | |
| 9 | .528 | 4.063 | 88.791 | | | |
| 10 | .403 | 3.101 | 91.893 | | | |
| 11 | .371 | 2.851 | 94.744 | | | |
| 12 | .361 | 2.780 | 97.524 | | | |
| 13 | .322 | 2.476 | 100.000 | | | |

*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණ දත්ත, 2022*

මෙහි වගු අංක 2 ට අනුව සංරචක 13 ක් හඳුනාගත හැකිය. ඒ අතුරින් විචල්‍යයන් 3 ක් ප්‍රමුඛ සංරචක වේ. පළමු, දෙවන හා තෙවන ප්‍රමුඛ සංරචකයන්හි අයිගන් අගයන් 4.399, 1.479 හා 1.402 ලෙස පවතින අතර මෙම ප්‍රමුඛ සංරචක තුන මඟින් මුල් පද්ධතියේ විචලනයෙන් 56% ක් විස්තර වන බව තවදුරටත් දැක්විය හැකිය.

Principal Component Analysis හා Principal Axis Factoring යන සාධක නිස්සරණ ක්‍රම යටතේ සාධක කැරකැවීම සඳහා භාවිතා කරන ක්‍රම වන Varimax, Quartimax හා Equimax යටතේ සාධක කැරකවීමෙන් පසු සාධක වෙන් වන ආකාරය පහත වගු අංක 3 මඟින් දක්වා ඇත. මෙහිදී ප්‍රමුඛ සාධක 3 ක් යටතේ සාධක වෙන්වී ඇති ආකාරය පෙන්නුම් කරයි.

වගු අංක 4 : සාධක විශ්ලේෂණය සඳහා ඇති විවිධ ක්‍රම යටතේ  සාධක වෙන්වීම

| | | Principal component Analysis | Principal Axis Factoring |
|---|---|---|---|
| **Varimax** | F1 | 1.අමුද්‍රව්‍ය හිගය හා මිල අධික වීම<br>2.ඉහළ යන යෙදවුම් පිරිවැය<br>3.නිෂ්පාදන අලෙවිකරණ ගැටළු මතුවීම<br>4.ආදේශක භාණ්ඩවලින් ඇතිවෙන අහිතකර බලපෑම<br>5.රජයේ සහයෝගයක් නොලැබීම<br>6.නිෂ්පාදන අමුද්‍රව්‍ය නිසි ප්‍රමිතියක් නොමැති වීම<br>7.නිසි  වෙළෙඳපොලක් නොමැතිවීම<br>8.කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක නොවීම | 1.අමුද්‍රව්‍ය හිගය හා මිල අධික වීම<br>2.ඉහළ යන යෙදවුම් පිරිවැය<br>3.නිෂ්පාදන අලෙවිකරණ ගැටළු මතුවීම<br>4.ආදේශක භාණ්ඩවලින් ඇතිවෙන අහිතකර බලපෑම<br>5.රජයේ සහයෝගයක් නොලැබීම<br>6.නිෂ්පාදන අමුද්‍රව්‍ය නිසි ප්‍රමිතියක් නොමැති වීම<br>7.නිසි  වෙළෙඳපොලක් නොමැතිවීම<br>8.කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක නොවීම |
| | F2 | 1.අවශ්‍ය යන්ත්‍රෝපකරණ ප්‍රමානවත්ව නොමැති වීම<br>2.ණය සැලසුම් ක්‍රම නොමැති වීම<br>3.සෞඛ්‍ය ගැටළු ඇති වීම | 1.අවශ්‍ය යන්ත්‍රෝපකරණ ප්‍රමානවත්ව නොමැති වීම<br>2.ණය සැලසුම් ක්‍රම නොමැති වීම<br>3.සෞඛ්‍ය ගැටළු ඇති වීම |
| | F3 | 1.බදු ගැටළු<br>2.විලාසිතා තාක්ෂණය නොමැති වීම | 1.බදු ගැටළු<br>2.විලාසිතා තාක්ෂණය නොමැති වීම |
| **Equamax** | F1 | 1.අමුද්‍රව්‍ය හිගය හා මිල අධික වීම<br>2.ඉහළ යන යෙදවුම් පිරිවැය<br>3.නිෂ්පාදන අලෙවිකරණ ගැටළු මතුවීම<br>4.ආදේශක භාණ්ඩවලින් ඇතිවෙන අහිතකර බලපෑම<br>5.රජයේ සහයෝගයක් නොලැබීම<br>6.නිෂ්පාදන අමුද්‍රව්‍ය නිසි ප්‍රමිතියක් නොමැති වීම<br>7.නිසි  වෙළෙඳපොලක් නොමැතිවීම<br>8.කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක නොවීම | 1.අමුද්‍රව්‍ය හිගය හා මිල අධික වීම<br>2.ඉහළ යන යෙදවුම් පිරිවැය<br>3.නිෂ්පාදන අලෙවිකරණ ගැටළු මතුවීම<br>4.ආදේශක භාණ්ඩවලින් ඇතිවෙන අහිතකර බලපෑම<br>5.රජයේ සහයෝගයක් නොලැබීම<br>6.නිෂ්පාදන අමුද්‍රව්‍ය නිසි ප්‍රමිතියක් නොමැති වීම<br>7.නිසි  වෙළෙඳපොලක් නොමැතිවීම<br>8.කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක නොවීම |
| | F2 | 1.අවශ්‍ය යන්ත්‍රෝපකරණ ප්‍රමානවත්ව නොමැති වීම.<br>2.ණය සැලසුම් ක්‍රම නොමැති වීම<br>3.සෞඛ්‍ය ගැටළු ඇති වීම | 1.අවශ්‍ය යන්ත්‍රෝපකරණ ප්‍රමානවත්ව නොමැති වීම<br>2.ණය සැලසුම් ක්‍රම නොමැති වීම<br>3.සෞඛ්‍ය ගැටළු ඇති වීම |
| | F3 | 1.බදු ගැටළු<br>2.විලාසිතා තාක්ෂණය නොමැති වීම | 1.බදු ගැටළු<br>2.විලාසිතා තාක්ෂණය නොමැති වීම |
| | | 1.අමුද්‍රව්‍ය හිගය හා මිල අධික වීම<br>2.ඉහළ යන යෙදවුම් පිරිවැය<br>3.නිෂ්පාදන අලෙවිකරණ ගැටළු මතුවීම | 1.අමුද්‍රව්‍ය හිගය හා මිල අධික වීම<br>2.ඉහළ යන යෙදවුම් පිරිවැය<br>3.නිෂ්පාදන අලෙවිකරණ ගැටළු මතුවීම |

| | | | |
|---|---|---|---|
| | F1 | 4.ආදේශක භාණ්ඩවලින් ඇතිවෙන අහිතකර බලපෑම<br>5.රජයේ සහයෝගයක් නොලැබීම<br>6.නිෂ්පාදන අමුද්‍රව්‍ය නිසි ප්‍රමිතියක් නොමැති වීම<br>7.නිසි වෙළෙඳපොලක් නොමැතිවීම<br>8.කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක නොවීම | 4.ආදේශක භාණ්ඩවලින් ඇතිවෙන අහිතකර බලපෑම<br>5.රජයේ සහයෝගයක් නොලැබීම<br>6.නිෂ්පාදන අමුද්‍රව්‍ය නිසි ප්‍රමිතියක් නොමැති වීම<br>7.නිසි වෙළෙඳපොලක් නොමැතිවීම<br>8.කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක නොවීම |
| | F2 | 1.අවශ්‍ය යන්ත්‍රෝපකරණ ප්‍රමානවත්ව නොමැති වීම<br>2.ණය සැලසුම් ක්‍රම නොමැති වීම<br>3.සෞඛ්‍ය ගැටළු ඇති වීම | 1.අවශ්‍ය යන්ත්‍රෝපකරණ ප්‍රමානවත්ව නොමැති වීම<br>2.ණය සැලසුම් ක්‍රම නොමැති වීම<br>3.සෞඛ්‍ය ගැටළු ඇති වීම |
| | F3 | 1.බදු ගැටළු<br>2.විලාසිතා තාක්ෂණය නොමැති වීම | 1.බදු ගැටළු<br>2.විලාසිතා තාක්ෂණය නොමැති වීම |

*මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත, 2022*

6.3 වගුවට අනුව පැහැදිලි වන්නේ Principal component Analysis හා Principal Axis Factoring යන ක්‍රම දෙක හරහාම සාධක එකම ආකාරයකට නිර්මාණය වී ඇති බවයි.

මෙලෙස Dilbeck (2017)ට අනුව සාධක විශ්ලේෂණ සිදු කිරීමට යෝග්‍ය ක්‍රමය Varimax ක්‍රමය වේ. මෙම පදනම මත Varimax ක්‍රමය උපයෝගි කර ගනිමින් සාධක නිර්මාණය කර ඇති ආකාරය පහත 5 වගුව මඟින් හඳුනා ගත හැකිය.


වගු අංක 5ඃ ප්‍රධාන සාධක නිර්මාණය කිරීම

| | **සංරචක** | | |
|---|---|---|---|
| | **1** | **2** | **3** |
| අමුද්‍රව්‍ය හිඟය හා මිල අධික විම | **.577** | .348 | -.283 |
| බදු ගැටළු | .003 | -.100 | **.689** |
| ඉහළ යන යෙදවුම් පිරිවැය | **.677** | .083 | .258 |
| අවශ්‍ය යන්ත්‍රෝපකරණ ප්‍රමාණවත්ව නොමැති වීම | .218 | **.740** | .131 |
| ණය සැලසුම් ක්‍රම නොමැති වී | .252 | **.628** | .253 |
| සෞඛ්‍ය ගැටළු ඇති වීම. | -.074 | **.755** | -.166 |
| නිෂ්පාදන අලෙවිකරණ ගැටළු මතුවීම | **.692** | .159 | -.291 |
| ආදේශක භාණ්ඩවලින් ඇති වෙන අහිතකර බලපෑම් | **.630** | .166 | -.120 |
| රජයේ සහයෝගයක් නොලැබීම | **.726** | .123 | .211 |
| විලාසිතා තාක්ෂණය නොමැති වීම | .046 | .239 | **.677** |
| නිෂ්පාදන අමුද්‍රව්‍යවල ගුණාත්මක බව අඩු වීම | **.622** | .116 | .356 |
| නිසි වෙළෙඳපොලක් නොමැති වීම | **.812** | -.001 | .066 |
| කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක නොවීම | **.817** | .023 | .007 |

*මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණ දත්ත, 2022*

වගු අංක 5 ට අනුව ප්‍රධාන වශයෙන් පේෂ කර්මාන්ත නිෂ්පාදකයින් මුහුණපාන ගැටළු ප්‍රධාන සංරචක 3ක් හඳුනාගත හැකිය.

එහිදී අමුද්‍රව්‍ය හිඟය හා මිල අධික වීම, ඉහළ යන යෙදවුම් පිරිවැය, නිෂ්පාදන අලෙවිකරණ ගැටළු මතුවීම, ආදේශක භාණ්ඩවලින් ඇති වෙන අහිතකර බලපෑම්, රජයේ සහයෝගයක් නොලැබීම, නිෂ්පාදන අමුද්‍රව්‍ය නිසි ප්‍රමිතියක් නොමැති වීම, නිසි වෙළෙඳපොලක් නොමැති වීම, කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක නොවීම යන සාධක රජය මැදිහත් නොවීමේ ගැටළු ලෙස ද, අවශ්‍ය යන්ත්‍රෝපකරණ ප්‍රමාණවත් ව නොමැති වීම, ණය සැලසුම් ක්‍රම නොමැති වීම, සෞඛ්‍ය ගැටළු ඇති වීම යන සාධක තාක්ෂණික හා සුභසාධක ගැටළු ලෙස ද, බදු ගැටළු හා විලාසිතා තාක්ෂණය නොමැති වීම යන සාධක මූල්‍ය හා නව්‍යකරණ ගැටළු වශයෙන් සංරචක තුනකට වෙන්කර ඇත.




රූප සටහන 1: නිෂ්පාදකයින් මුහුණපාන ගැටළු

*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2022*

## 7. නිගමන සහ යෝජනා

පේෂ කර්මාන්ත නිෂ්පාදන සිදු කිරීමේ දී නිෂ්පාදකයින් මුහුණපාන ගැටළු හඳුනා ගැනීම සඳහා සිදු කරනු ලැබූ සාධක විශ්ලේෂණයට අනුව ප්‍රධාන වශයෙන් පේෂ කර්මාන්ත නිෂ්පාදකයින් මුහුණපාන ගැටළු 3 ක් හඳුනාගත හැකි විය. ඒවා නම් රජය මැදිහත් නොවීමේ ගැටළු, තාක්ෂණික හා සුබසාධන ගැටළු, මූල්‍ය හා නව්‍යකරණ ගැටළු යන සාධක පෙන්වා දිය හැකිය. එම නිසා කර්මාන්තය ආශ්‍රිත හඳුනා ගනු ලැබූ ගැටළු සඳහා පහත යෝජනා ඉදිරිපත් කළ හැකිය.

ඉහත කරුණු අනුව පැහැදිලි වන්නේ පේෂ කර්මාන්ත නිෂ්පාදකයින් නිෂ්පාදන කටයුතු සිදු කිරීමේ දී බොහෝමයක් ගැටළු වලට මැදි වී සිටින බව පර්යේෂණය මඟින් නිගමනය කර ගත හැකි විය.

නව නිෂ්පාදන සංවර්ධනය කිරීම පේෂ කර්මාන්ත නිෂ්පාදකයින්ගේ දේශීය නිපුණතා මත පදනම් වන අතර පවතින යටිතල පහසුකම්, තාක්ෂණික හා අලෙවිකරණ අංශයන් පිළිබඳ විශේෂිත දැනුමක් ඇති ආයතන හෝ පුද්ගලයින් විසින් හැසිරවිය යුතුය. එනම් දේශීය හා අපනයන වෙළෙඳපොල තුළ ඉලක්කගත පාරිභෝගිකයන්ගේ රුචි අරුචිකම්වලට අනුකූලව නිෂ්පාදන සංවර්ධනය කළ යුතුය. ඒ සඳහා අලෙවිකරණය සඳහා අන්තර්ජාලය, නවීන විද්‍යුත් මාර්ග යොදා ගැනීම හා තාක්ෂණික ක්‍රම ලෙස නව විලාසිතා තාක්ෂණය, නවීන යන්ත්‍රසූත්‍ර පිළිබඳ විශේෂ පුහුණුවක් නිෂ්පාදකයන්ට ලබාදීම වැදගත් වේ.

රජය මඟින් මෙම කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ආනයනික රෙදිපිළි සීමා කිරීම, විදේශ ආධාර මඟින් පේෂ කර්මාන්ත නිෂ්පාදන වැඩි දියුණු කිරීම සඳහා පුහුණු මධ්‍යස්ථාන හා කුඩා රෙදි නිෂ්පාදන මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කළ යුතුය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව. (2020). වාර්ෂික කාර්යසාධන වාර්තාව. 11 07, 2021 https://www.parliament.lk/uploads/documents/paperspresented/1642667734024267.pdf

ශ්‍රී ලංකා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව. (2018). වාර්ෂික කාර්යසාධන වාර්තාව. 11 24, 2021 https://www.parliament.lk/uploads/documents/papers presented /performance-report-ministry-of-industry-commerce-2018.pdf

ශ්‍රී ලංකා කර්මාන්ත හා වාණිජ කටයුතු දෙපාර්තමේන්තුව. (2018). වාර්ෂික කාර්යසාධන වාර්තාව. 11 22, 2021. https://www.parliament.lk /uploads/ documents/paperspresented/performance-report-ministry-of-industry-commerce-2018-si.pdf

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය. (2020) .වාර්ෂික වාර්තාව. විදේශ අංශයේ ප්‍රවණතා හා ප්‍රතිපත්ති. 11 07, 2021, https://www.cbsl.gov.lk/ sites/default/files /cbslweb_documents/ publication/annual _report /2020/si/9_Chapter_05.pdf

Hasan, K. M. F. (2021). Community Entrepreneurship and Enviromental Sustainability of the Handloom sector. *Handloom sustainability and culture*, 21-47. Retrieved on 11th April, 2021, from https://scholar. google.com/scholar?hl=en&as_sdt=0%2C5&q=handloom++ industry

+problems+yapanay+2018+kumar+sri+lanka&btnG=#d=gs_qabs&t=1650519085863&u=%23p%3D6lk bQDkPwfIJ

Goswami, K. (2018). Micro-Entrepreneurship Development in the Handloom Industry. International Journal of Rural Management, 14(1),22-38. Retrieved on 17th September, 2021, from doi.org/10.1177 /0973005218754437

Gunatilaka, R. (1997). The problems and prospects of Sri Lanka's handloom industry. *Institute of Policy Studies Victoria University of Welling*:Retrieved on 23rd September, 2021, from https:// scholar.google.com/scholar?hl=en&as_sdt=0%2C5&q=handloom +industry+problems+1997+gunathilaka+sri+lanka&btnG=#d=gs_qabs&t=1650517244102&u=%23p%3DWZez4WJvB_IJ

Hettiarachchige, G., V. (2020). A zero-waste garment construction approach using an indigenous textile weaving craft. *International Journal of Fashion Design, Technology and Education*,13 (1), 101–109. Retrieved on 13th December, 2021, from doi.org/10 .1080/17543266.2020.1725148

Kelegama, S., & Foley, F. (1999). Impediments to promoting backward linkages from the garment industry in Sri Lanka. World Development,*27*(8),1445-1460.

Nussbaum, M. A. (2007). Effects of wearing chemical protective clothing on text entry when using wearable input devices.*International Journal of Industrial Ergonomics 7*(6),525-530.Retrieved on 27th September, 2021, from doi.org/10.1016/j.ergon.2007.02.008

Risna, U. F., & Banu, M. N. (2021). A Study On the Problems, And Issues of the Handloom Industry; A Special Reference of Maruthamunai Area. *Journal of Image Processing and Intelligent Remote, Sensing 11*, 1–12.

Wijenayaka, H. M. D. S. (2021). Challenges of handloom industry in Sri Lanka: a case study from Ihala Madampella village. *University of Jaffna*: Retrieved 23rd November, 2021, from https://scholar. google.com/schplar?hl=en&as_sdt=0%2C5&q=handloom+ industry+ problems+2021+wijenayaka+sri+lanka&btnG=#d=gs_qabs&t=1650519269881&u=%23p%3DDofzAvZ7P_0J